# මානව අවශේෂ පිළිබඳ ඩී.එන්.ඒ. පර්යේෂණ සඳහා වූ ආචාර ධර්ම: ගෝලීයව අදාලවන මාර්ගෝපදේශ පහක්

Songül Alpaslan-Roodenberg[1,2], David Anthony[3,4], Hiba Babiker[5], Eszter Bánffy[6], Thomas Booth[7], Patricia Capone[8], Arati Deshpande-Mukherjee[9], Stefanie Eisenmann[5,10], Lars Fehren-Schmitz[11,12], Michael Frachetti[13], Ricardo Fujita[14], Catherine J. Frieman[15], Qiaomei Fu[16], Victoria Gibbon[17], Wolfgang Haak[5], Mateja Hajdinjak[7], Kerstin P. Hofmann[6], Brian Holguin[18], Takeshi Inomata[19], Hideaki Kanzawa-Kiriyama[20], William Keegan[21], Janet Kelso[10], Johannes Krause[10], Ganesan Kumaresan[22], Chapurukha Kusimba[23], Sibel Kusimba[23], Carles Lalueza-Fox[24], Bastien Llamas[25,26], Scott MacEachern[27], Swapan Mallick[1,28,29], Hirofumi Matsumura[30], Ana Y. Morales-Arce[31], Giedre Motuzaite Matuzeviciute[32], Veena Mushrif-Tripathy[9], Nathan Nakatsuka[1], Rodrigo Nores[33], Christine Ogola[34], Mercedes Okumura[35], Nick Patterson[4,29], Ron Pinhasi[2], Samayamantri P.R. Prasad[36], Mary E. Prendergast[37], Jose Luis Punzo[38], David Reich[1,4,28,29], Rikai Sawafuji[39], Elizabeth Sawchuk[40,41], Stephan Schiffels[5,10], Jakob Sedig[1,4], Svetlana Shnaider[42], Kendra Sirak[1,4], Pontus Skoglund[7], Viviane Slon[43,44], Meradeth Snow[45], Marie Soressi[46], Matthew Spriggs[15,47], Philipp W. Stockhammer[10,48,], Anna Szécsényi-Nagy[49], Kumarasamy Thangaraj[36,50], Vera Tiesler[51], Ray Tobler[23,25], Chuan-Chao Wang[52,53], Christina Warinner[10,54], Surangi Yasawardene[55], Muhammad Zahir[5,56]

**සිංහල පරිවර්තනය : සුරංගි යසවර්ධන විසිනි[55]**

1: Department of Genetics, Harvard Medical School, Boston, MA, USA
2: Department of Evolutionary Anthropology, University of Vienna, Austria
3: Department of Anthropology, Hartwick College, Oneonta, NY, USA
4: Department of Human Evolutionary Biology, Harvard University, Cambridge, MA, USA
5: Max Planck Institute for the Science of Human History, Jena, Germany
6: Romano-Germanic Commission of the German Archaeological Institute, Frankfurt am Main, Germany
7: Francis Crick Institute, London, UK
8: Peabody Museum of Archaeology and Ethnology, Harvard University, MA, USA
9: Department of Ancient Indian History Culture and Archaeology, Deccan College Post Graduate and Research Institute, Pune, India
10: Max Planck Institute for Evolutionary Anthropology, Leipzig, Germany
11: Department of Anthropology, University of California, Santa Cruz, CA, USA
12: UCSC Genomics Institute, University of California, Santa Cruz, CA, USA
13: Department of Anthropology, Washington University in St. Louis, St. Louis, MO, USA
14: Centro de Genética y Biología Molecular, Facultad de Medicina, Universidad de San Martín de Porres, Lima, Peru
15: School of Archaeology and Anthropology, The Australian National University, Canberra, Australia
16: Key Laboratory of Vertebrate Evolution and Human Origins, Institute of Vertebrate Paleontology and Paleoanthropology, Center for Excellence in Life and Paleoenvironment, Chinese Academy of Sciences, Beijing, China
17: Division of Clinical Anatomy and Biological Anthropology, Department of Human Biology, University of Cape Town, Cape Town, South Africa
18: Department of Anthropology, University of California, Santa Barbara, CA, USA
19: School of Anthropology, University of Arizona, Tucson, AZ, USA
20: National Museum of Nature and Science, Ibaraki, Japan
21: Florida Museum of Natural History, Gainesville, FL, USA

22: Department of Genetics, School of Biological Sciences, Madurai Kamaraj University, Tamil Nadu, India
23: Department of Anthropology, University of South Florida, Tampa, FL, USA
24: Institute of Evolutionary Biology (CSIC-UPF), Barcelona, Spain
25: Australian Centre for Ancient DNA, School of Biological Sciences and The Environment Institute, University of Adelaide, Adelaide, SA, Australia
26: ARC Centre of Excellence for Australian Biodiversity and Heritage, University of Adelaide, Adelaide, SA 5005, Australia
27: Office of the Chancellors, Duke Kunshan University, Jiangsu, China
28: Howard Hughes Medical Institute, Boston, MA, USA
29: Broad Institute of MIT and Harvard, Cambridge, MA, USA
30: School of Health Science, Sapporo Medical University, Sapporo, Hokkaidō, Japan
31: Institute of Ecology and Evolution, University of Bern, Bern, Switzerland
32: Lithuanian Institute of History and Department of Archaeology, History Faculty, Vilnius University, Vilnius, Lithuania
33: Departamento de Antropología, Facultad de Filosofía y Humanidades, Universidad Nacional de Córdoba, Instituto de Antropología de Córdoba (IDACOR), CONICET, Córdoba, Argentina
34: Earth Sciences Department, National Museums of Kenya, Nairobi, Kenya
35: Department of Genetics and Evolutionary Biology, University of São Paulo, São Paulo, Brazil
36: DBT-Centre for DNA Fingerprinting and Diagnostics, Hyderabad, India
37: Department of Anthropology, Rice University, Houston, TX, USA
38: Instituto Nacional de Antropología e Historia, Michoacán, Mexico
39: School of Advanced Sciences, The Graduate University for Advanced Studies (SOKENDAI), Hayama, Kanagawa, Japan
40: Department of Anthropology, University of Alberta, Edmonton, Alberta, Canada
41: Department of Anthropology, Stony Brook University, Stony Brook, NY, USA
42: ArchaeoZOOlogy in Siberia and Central Asia – ZooSCAn, CNRS – IAET SB RAS International Research Laboratory, Novosibirsk, Russia
43: Department of Anatomy and Anthropology and Department of Human Molecular Genetics and Biochemistry, Sackler Faculty of Medicine, Tel Aviv University, Tel Aviv, Israel
44: The Dan David Center for Human Evolution and Biohistory Research, Tel Aviv University, Tel Aviv, Israel
45: Anthropology Department, University of Montana, Missoula, MO, USA
46: Faculty of Archaeology, Leiden University, Leiden, Netherlands
47: Vanuatu Cultural Centre, Port Vila, Vanuatu
48: Institute for Pre- and Protohistoric Archaeology and Archaeology of the Roman Provinces, Ludwig Maximilian University, Munich, Germany
49: Institute of Archaeogenomics, Research Centre for the Humanities, Eötvös Loránd Research Network, Budapest, Hungary
50: CSIR-Centre for Cellular and Molecular Biology, Hyderabad, India
51: School of Anthropological Sciences, Universidad Autónoma de Yucatán, Mérida, Mexico
52: Department of Anthropology and Ethnology, Institute of Anthropology, School of Sociology and Anthropology, and State Key Laboratory of Cellular Stress Biology, School of Life Sciences, Xiamen University, Xiamen, China
53: School of Basic Medical Sciences, Zhejiang University School of Medicine, and Institute of Asian Civilizations, Zhejiang University, Hangzhou, China
54: Department of Anthropology, Harvard University, Cambridge, MA, USA
55: Department of Anatomy, University of Sri Jayewardenepura, Nugegoda, Sri Lanka
56: Department of Archaeology, Hazara University, Mansehra, Pakistan

**ලිපි ආදිය ලැබිය යුතු අය :** Lars Fehren-Schmitz (lfehrens@ucsc.edu), Mary Prendergast (mary@rice.edu), David Reich (reich@genetics.med.harvard.edu), Jakob Sedig (Jakob_Sedig@hms.harvard.edu), Kendra Sirak (Kendra_Sirak@hms.harvard.edu), Philipp Stockhammer (philipp.stockhammer@lmu.de), Surangi Yasawardene (surangi@sjp.ac.lk)

**පෙරවදන**

අපි රටවල් තිස්එකක් සහ විවිධ ගෝලීය ප්‍රජාවන් නියෝජනය කරණ පුරාවිද්‍යාඥයන්, මානව විද්‍යාඥයන්, කෞතුකාගාර භාරකාරවරුන් සහ ජාන විද්‍යාඥයන් කණ්ඩායමක් වෙමු. පෞරාණික ඩී.එන්.ඒ. පර්යේෂණවල ආචාරධර්ම පිළිබඳව කැපවුණු වැඩමුළුවක් ලෙස 2020 නොවැම්බර් මාසයේදී අප කණ්ඩායමේ බොහෝ දෙනෙකු දුරස්ථ තාක්ෂණය භාවිතා කරමින් ඊට සහභාගි වූහ. ගෝලීය වශයෙන් අදාළ වන සදාචාරාත්මක මාර්ගෝපදේශවල අවශ්‍යතාවය ගැන බොහෝ දුරට පුළුල් එකඟතාවයක් තිබෙන නමුදු, උතුරු ඇමෙරිකාවේ සිදු කළ මානව අවශේෂ පිළිබඳ පර්යේෂණ සාකච්ඡා පදනම් කර ගෙන ඉදිරිපත් කර ඇති මෑත කාලීන නිර්දේශ සැමවිටම මුළු ලෝකයටම බලපාන ලෙස සාමාන්‍යකරණය කිරීම දුෂ්කර වේ. විවිධ පසුබිම් ද සැලකිල්ලට ගනිමින් සමස්ත ලෝකයටම සුදුසු යයි සැලකිය හැකි පහත සඳහන් මාර්ගෝපදේශ අපි යෝජනා කරන්නෙමු. ඒ අනුව -

1. පර්යේෂකයන් ඔවුන් සේවය කරණ ස්ථානවල සහ මානව අවශේෂ (දේහ කොටස්) ලබා ගත් ස්ථානවල රෙගුලාසි සියල්ලම අනුගමනය කරණ බවට වග බලා ගත යුතුය.

2. කවර හෝ අධ්‍යයනයක් ආරම්භ කිරීමට පෙර පර්යේෂකයන් විස්තරාත්මක සැලසුමක් පිළියෙළ කළ යුතුය.

3 මානව අවශේෂ (දේහ කොටස්) වලට සිදු වන හානි අවම කිරීමට පර්යේෂකයන් ක්‍රියා කළ යුතුය.

4.විද්‍යාත්මක ප්‍රතිඵල ප්‍රකාශ කළ පසු, ඒවා විවේචනාත්මකව නැවත පරීක්ෂා කිරීමට හැකි වන පරිදි අදාළ දත්ත ලබා ගැනීමට පර්යේෂකයන්, ඉඩ සැලසිය යුතුය.

5. අධ්‍යයනයක ආරම්භයේ සිටම අනිකුත් පාර්ශවකරුවන් සමග පර්යේෂකයන් සබඳතා පැවැත්විය යුතු අතර පාර්ශවකරුවන්ගේ අදහස් වලට හා සංවේදීතාවනට ගරු කළ යුතුය.

මෙම මාර්ගොපදෙශයන් පිළිපැදීමට අපි කැප වෙන අතර එමගින් උසස් සදාචාරාත්මක ප්‍රමිතියක් බිහි වෙතැයි අපේක්ෂා කරමු.

**හැඳින්වීම**

අතීතයේ ජීවත්වූ මිනිසුන් අතරවූ අන්‍යොන්‍ය සබඳතා ගැන මෙන්ම දැන් ජීවත් වන්නවුන් සමග විය හැකි සබඳතා පිළිබඳව විමසා බැලීම සඳහා, පෞරාණික මානව ජෙනොම විශ්ලේෂණ ප්‍රබල ප්‍රවේශයක් ලෙස දියුණු වී ඇත. ඉතා දිගු කලක් තුල සිදුවී ඇති සංචරණ හා අන්‍යොන්‍ය සබඳතා, කිසියම් ප්‍රදේශයක් දිගු කලක් මුළුල්ලේ මානව වාසස්ථාන ලෙස පැවතීමට හේතුව, වී ඇතැයි යන්න සංගත තේමාවක් වී ඇත. ජනසංඛ්‍යාවකගේ වාර්ගිය

'පවිත්‍රතාවය' පිලිබඳ මිථ්‍යාවන් ව්‍යාජ බවටත් ජාති වාර්ගිය සහ ජාතිවාදී කථනයන් අසත්‍ය බවටත් වෙනත් අධ්‍යයන ශික්ෂණයන් වලින් ලැබී ඇති සාක්ෂි වලට අමතරව පෞරාණික ඩී.එන්.ඒ පරීක්ෂණ වලින්, නව සාක්ෂි පසුගිය දශකය තුල මතු වී ඇත. කිසියම් ජන සමූහයකට අයත් බව තීරණය කිරීමට සමහරුන් ජාන විද්‍යාව අවියක් ලෙස භාවිතා කිරීමට තැත් කර ඇති අතර, අනන්‍යතාවය පිලිබඳ තීරකයකු ලෙස ජාන දත්ත භාවිතා කිරීම නුසුදුසුය යනු අපගේ මතය වේ[1] .

ආදි මානවයන්ගෙන් ලබා ගත් ජෙනොමේ දත්ත ප්‍රකාශනය වීම ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. 2009 දී එවැනි දත්ත කිසිවක් නොවූ අතර අද පුද්ගලයන් හයදහසකටත් වැඩි සංඛ්‍යාවක් පිළිබඳව එවැනි දත්ත පළවී ඇත. පැරැන්නන් පිළබඳ ඩී.එන්.ඒ පර්යේෂණ, සදාචාරාත්මකව සිදු කළ යුතු ආකාරය පිළිබඳව පෙර සිදුවී ඇති සංවාද පදනම් කර ගෙන[2-16], තව සාකච්ඡා කිරීම් වර්ධනය වෙමින් පවතී[17-24]. මෙම ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනය නිසා ද, මුතුන් මිත්තන්, පරම්පරා, පෙළපත් හැඳෑරීම නිසා ඇතිවන සමාජීය හා දේශපාලනික බලපෑම් නිසා සහ පෞරාණික ඩී.එන්.ඒ. පර්යේෂණවලින් විශ්ලේෂණය වනුයේ අතීතයේ ජීවත්වූ සහ ගරු කළ යුතු ජන සංඛ්‍යාවක් ගැන වන බැවින් ද ඩී.එන්.ඒ පර්යේෂණවල සදාචාරාත්මකබව පිළබඳව කඩිනම් අවශ්‍යතාවයක් ඇතිවී තිබේ.

පුරාතන පුද්ගලයන් ගැන විශ්ලේෂණය කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා වන ආයතනික හෝ රාජ්‍ය මාර්ගෝපදේශ වෙනස් වන අතර එමගින් සැමවිටම සදාචාරාත්මක හා නියැලෙන පර්යේෂණ අපේක්ෂා කළ හැකි නොවේ. ඇතැම් පාලන ආයතන විසින් අපේක්ෂා කරණ ප්‍රමිතියනට වඩා ඉහල ප්‍රමිතියක් සැලසීමේ වගකීමක් පර්යේෂකයන් සතුව ඇත. එනමුත් ඉන් අපේක්ෂා වනුයේ කවරක් දැයි යන්න ගැන එකඟතාවක් නැත[11,25-27]. පර්යේෂණ කණ්ඩායම් සදාචාරාත්මක ගැටළු ආමන්ත්‍රණය කළ අන්දම ගැන විස්තර දැක්වෙන ප්‍රකාශ ද , පෞරාණික ඩී.එන්.ඒ. පර්යේෂණ ප්‍රකාශන (වාර්තා) වලට වැඩි වැඩියෙන් ඇතුළු කර ඇති අතර[28-38] එම ක්‍රියාව අපි අගය කරමු. විද්වතුන්ගේ සංවිධානයන් ද මාර්ගෝපදේශ පැහැදිලි කර දැක්වීමට එළඹ ඇති අතර[15-39] පැරණි උතුරු ඇමෙරිකානුවන් පිලිබඳ පර්යේෂණ වලදී පැන නැගෙන මෙම ගැටළු ගැන අධ්‍යයනය කිරීමට අවම වශයෙන් එක් ආධාර මුදලක් දැනටමත් ප්‍රදානය කර ඇත. කෙසේවුවද, පෞරාණික ඩී.එන්.ඒ. පර්යේෂණ වල යෙදී සිටින ජාත්‍යන්තරව විවිධ පසුබිම් නියෝජන කරණ උගතුන් කණ්ඩායමක් විසින් ආචාර ධර්ම පිලිබඳව එක්ව අත්සන් කළ ප්‍රකාශනයක් නොමැතිවීම සැලකිය යුතු අඩුවක්ව පවතී.

දුරස්ථ තාක්ෂණය භාවිතයෙන් සදාචාරාත්මකත්වය ගැන වැඩ මුළුවක් සඳහා 2020 නොවැම්බර් 4-5 දිනට, විවිධ ගෝලීය ජන කොට්ඨාස නියෝජනය කරමින් රටවල් තිහකටත් වැඩි සංඛ්‍යාවක පුරාවිද්‍යාඥයන්, මානව විද්‍යාඥයන්, කෞතුකාගාර භාරකාරවරුන් සහ ජාන විද්‍යාඥයන් හැටකට වැඩි සංඛ්‍යාවකට අපි ආරාධනා කළෙමු.

පාර්ශවකරුවන්ගේ (ආදී ජන වාර්ගික කණ්ඩායම් වලින් පැවතෙන්නන් ඇතුලු, මානව අවශේෂ පිලිබඳ භාරකාරත්වය දරන්නන් සහ පර්යේෂකයන්) විවිධ අදහස් උදහස් වලට සංවේදිතාව දක්වමින් පෞරාණික ඩී.එන්.ඒ පර්යේෂණ සදාචාරාත්මකව සිදු කිරීමට, වැඩමුළුවට සහභාගී වූ සියලුම දෙනා කැපවී සිටිති. ජන කණ්ඩායම් සහ ස්වදෙශීය සමූහයන් සම්බන්ධිත ගැටළු වල පෘථුලත්වය සහ අදාළ ගැටළු ලොව තුල වෙනස්වන අන්දම මතු කර විදහා දැක්වීම සඳහා, ලෝකයේ විවිධ ප්‍රදේශ වල සිදු කරණ ලද අධ්‍යයන අපි මෙහි ඉදිරිපත් කරමු. ගෝලීය වශයෙන් අදාල වන මානව අවශේෂ පිලිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා මාර්ගෝපදේශ අපි ඉදිරිපත් කරමු (කොටු අංක1).

## ප්‍රජාවන් සමග සදාචාරාත්මක මෙහෙයුම් සිදු කළ යුත්තේ අදාළ පසුබිමට විශේෂිතව ය

පුරාතන පුද්ගලයන් පිලිබඳ සදාචාරාත්මක ඩී.එන්.ඒ. පර්යේෂණ ප්‍රකාශන වලින් වැඩි වශයෙන් අවධානය යොමුවී තිබෙනුයේ ඇමෙරිකා එක්සත් ජනපදය කෙරෙහි ය[3,4,13,15]. පර්යේෂකයන් හා ආදිවාසී ජන කණ්ඩායම් අතර සබඳතා වර්ධනය කිරීම සඳහා එම සාකච්ඡා වලින් නිර්දේශයන් ඉදිරිපත් වී ඇත. සියලුම පෞරාණික ඩී.එන්.ඒ අධ්‍යයනවලදී විධිමත් අන්දමේ සාකච්ඡා පැවැත්වීම්, සංස්කෘතික හා සදාරාචාත්මක කරුණු ගැන අවධානය යොමු කිරීම්, ප්‍රජා කණ්ඩායම් සමග සම්බන්ධවී ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම් වලට සහායවීම්, දත්ත වාර්තා කිරීම සහ කළමනාකරණය පිලිබඳ සැලසුම් සකස් කිරීම් ගැන සහ දීර්ඝ-කාලීන වගකීම් හා භාරකාරත්වය පිළිබඳව හඟවමින්; ඇමෙරිකානු මානව ජාන විද්‍යා සංගමය විසින් පර්යේෂණ උපදේශාත්මක ප්‍රකාශනයක සාරාංශනාත්මක සටහනක් පළ කර ඇත[15].

යටත් විජිතවාදී ආක්‍රමණ වලට ගොදුරුවී, ඉඩම් අල්ලා ගැනීම් හා ආදිවාසී ප්‍රජා වන්ගේ ඉඩකඩම් හා මානවකෘති බලහත්කාරයෙන් පවරා ගැනීම්, දේශීය ජන කණ්ඩායම්වලට දිගින් දිගටම ඡන්ද බලය අහිමිකිරීම් වලට භාජනය වී ඇති ප්‍රදේශවල ජන කණ්ඩායම් සමග සාකච්ඡා නොකිරීමෙන් හානියක් සිදුවිය හැකි බැවින්, එවැනි ප්‍රදේශවල දේශීය සිතුම් පැතුම් වලට වැදගත් තැනක් දීම තීරණාත්මක වේ[5,6].

ඇමෙරිකානු ෆෙඩරල් ආණ්ඩුවෙන් ආධාර ලබන ආයතනවල තැන්පත් කර ඇති ඇමෙරිකා එක්සත් ජනපදයේ දේශීය ඇමෙරිකානුවන්ගේ මානව අවශේෂ, ස්වදේශික ඇමෙරිකානු සොහොන් ආරක්ෂා කිරීමේ හා භාරය පැවරීමේ පනතින් (NAGPRA)අධීක්ෂණය වේ. පුරාතන වැසියන්ගේ මානව අවශේෂ, (සංස්කෘතිකව හඳුනා ගැනීමට හැකිවුවත් හෝ නොවුවත් ) ඒ ගැන අදාල ආයතන විසින් සාකච්ඡා කර ස්වදෙශීය ජන කණ්ඩායම් වලට භාර දීමට ක්‍රියා කළ යුතු බව එම පනතින් අනිවාර්ය වේ. ඕස්ට්‍රෙලියාවේ ඒ හා සමාන නීතිවලින් අවුරුදු 40,000 ක් තරම් පැරණි[40] ආදිවාසීන්ගේ හා ටොරෙස් දිවයින් ජනයාගෙන්

ලබා ගෙන ඇති මානව අවශේෂ වල භාරකාරත්වය පැවරීමට තැත් කෙරේ [41,42]. වර්තමාන ජන කණ්ඩායම් වලට ද්‍රව්‍යමය හෝ වාචික සබඳතා ස්වල්පයක්වත් ඇති හෝ නැති පුරාතන පුද්ගලයන්ගේ මළ සිරුරු කොටස් පිළිබඳව පර්යේෂණ සිදු කරණ විට, හෝ ඇතැම් කණ්ඩායම්වලට අන් කණ්ඩායම්වලට වඩා සංස්කෘතික උරුමයනට අයිතිය ඇතැයි යන අදහස දිරි ගැන්වීමේදී සමාජ සට්ටනවලට තුඩු දිය හැකි බැවින් සෑම පුරාතන පුද්ගලයකුම වර්තමාන කණ්ඩායමක් සමග සම්බන්ධ කළ යුතුය යන්න අනිවාර්ය කරණ ස්වදෙශීයයන්-කේන්ද්‍රගත සදාචාරාත්මක රාමුවක් නොගැලපේ.

## ස්වදෙශීය දෘෂ්ටි කෝණයන් නියෝජනය කිරීම

ඇමෙරිකානු රටවල් බොහොමයක දේශීය උරුමයන් ජාතික අනන්‍යතාවට කාවද්දා රාජ්‍ය සංස්කෘතික ආයතනවලට අනුකලනය කර ඇත. උදාහරණයක් වශයෙන්, ස්වාධීනත්වය ලැබීමෙන් පසු, මෙක්සිකෝවේ ජනගහනයෙන් වැඩි දෙනෙකු වන මෙස්ටිසොවරු (මිශ්‍ර මුතුන් මිත්තන් ගෙන් පැවත එන්නන්) ජාතික අනන්‍යතාවයේ අඛණ්ඩ කොටසක් ලෙස නහුවා (ඇස්ටෙක් ),මායා, සැපොටෙක් සහ වෙනත් ආදිවාසී කණ්ඩායම්වලින් උරුමයන් වැළඳ ගත්හ[43-45]. පේරු රටෙහි සංස්කෘති අමාත්‍යාංශය පිහිටුවන ලද්දේ ස්වදේශීය සංස්කෘතිය දිරි ගැන්වීම සහ වෙනස්කම්වලට විරුද්ධව කටයුතු කිරීමේ ඉලක්කය ඇතිව එරටෙහි පිහිටුවන ලද ව්‍යාපාරයක් (*indigenismo*) පදනම් කර ගෙනය[46-48]. එවැනි සන්ධර්භ තුල මානව අවශේෂ විශ්ලේෂණය කිරීම සඳහා රජයෙන් හෝ උරුමයන් සම්බන්ධ සංවිධානවලින් අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාමාර්ගය ප්‍රබල වූවක් විය හැකි අතර එක්සත් ජනපද ආකෘතියක් යොදා ගැනීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම ව්‍යර්ථ විය හැක. මධ්‍යම සහ දකුණු අමෙරිකාවේ පෞරාණික ඩී.එන්.ඒ පරීක්ෂණ පිලිබඳ ශාස්ත්‍රීය ලිපි පල කරන ලදුව, එම අධ්‍යයනයන් ස්වදේශීය ජනයා සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ පිළියෙළ කළ ප්‍රමිතීන් වලට අනුකූල වී නැතැයි යනුවෙන් ලද විවේචන පිලිබඳ බොහෝ අත්දැකීම් මෙම ලිපිය සම්පාදනය කළ කතුවරුන්ට ඇත[3,4]. එක්සත් ජනපදයේ සිදු කර ඇති ප්‍රමාණයට වඩා බොහෝ ස්ථානවල ස්වදේශීය උරුමයන් වැළඳ ගෙන රජයේ අනුමත කිරීමේ ක්‍රියාමාර්ගවලට හා සංස්කෘතික ආයතනවලට දැඩි ලෙස ඒකාබද්ධ කර ඇති බැවින්, මෙක්සිකෝව සහ මධ්‍යම හා දකුණු ඇමෙරිකා රටවල අපට හැඟෙනුයේ එම විවේචන අධික ලෙස අතිශෝක්තියෙන් යුතු වූ හෝ යටත් විජිතවාදී මානසිකත්වයකින් යුතුවූ ඒවා ලෙසය.

කෙසේ වුවද, ඇමෙරිකානු රටවල, රජයන් සහ ප්‍රජාවන් ආදිවාසී ප්‍රජාවන් අතර පවතින සබඳතාවල බොහෝ වෙනස් ස්වභාවයන් දක්නට ඇත. අමතර තොරතුරු අවශ්‍යවීම් ගැන තීරණය කිරීමේදී පර්යේෂකයන් එකින් එක අනුව විමසා බැලිය යුතුවේ. ස්වදේශීය උරුමය අනන්‍යතාවේ වැදගත් අංගයක් වන ප්‍රජා කොටස්, පේරු හා මෙක්සිකෝවේ රාජ්‍ය තන්ත්‍රයේ

විවලාා නියෝජනයක් වේ. බ්‍රසීලයේ ස්වදේශීය ප්‍රජාවන්ට බොහෝ විට ඡන්ද බලය අහිමි අතර, තමන්ගේ මුතුන් මිත්තන්ගේ පුරාවිද්‍යාත්මක නටබුන්වල ඉරණම පිලිබඳ හඬක් නැගීමට නීතිමය යාන්ත්‍රණයක් ස්වදේශීය ප්‍රජාවට නොමැත[49]. ස්වදේශීය උරුමය සම්බන්ධිත කවර හෝ ව්‍යාපෘතියක් සිදු කිරීමට එකී ප්‍රජාවගේ අනුමැතිය ලබා ගත යුතුය යන නීතිමය නියෝගය ආර්ජෙන්ටිනාවේ සැමවිටම අනුගමනය නොකෙරේ. ජනගහනයෙන් අඩක් පමණ වන මායාවරු සහ වෙනත් ස්වදේශීය ජන කණ්ඩායම් ගෝත්‍රමාලාවේ කොන් කිරීමට ලක්ව ඇත. එවැනි අවස්ථාවලදී පෞරාණික ඩී.එන්.ඒ පර්යේෂණ කණ්ඩායමක සාමාජිකයන්ගේ සදාචාරාත්මක වගකීම වනුයේ ස්වදේශීය ප්‍රජාවගේ සිතුම් පැතුම් ඇතුළු කිරීම සඳහා පනවා ඇති නීතිමය සීමාවන් ඉක්මවා ක්‍රියා කිරීමය.

## ස්වදෙශීයත්වයේ අර්ථය පිලිබඳ ගෝලීය වෙනස්කම්

ස්වදෙශීයත්වය යන්නෙහි අර්ථය ගෝලීයව වෙනස් වේ. යටත් විජිතවාද පාලන යටතේ සිටි ප්‍රජාවන්ගෙන් පැවතෙන්නන් දැන් අප්‍රිකාවේ ඉතා ප්‍රබල ලෙස බලය ලබා සිටින අතර, ස්වදෙශීයත්වය යන්නෙන් අදහස් වනුයේ කිසියම් ප්‍රදේශයක ජන කණ්ඩායම් ස්ථාපනය වී සිටීමෙන් ඇතිවූ සම්ප්‍රදායනට වඩා බොහෝ විට අනන්‍යතාව මත දේශපාලනික හෝ සමාජයීයව කොන්කිරීම් වලට ලක්වීම් සඳහන් වීම ගැනය[50]. බොහෝ අප්‍රිකානු ප්‍රජාවන්ට, යටත්විජිතවාදී හා පශචාත්-යටත්විජිතවාදී කාලවලදී සිදුවූ අවතැන්වීම් හා අවුල්වීම් ඇතුළුව, ඔවුන් වාසය කරණ ඉඩ කඩම් හා පවතිනුයේ සංකීර්ණ සබඳතා ය. සමහර ප්‍රදේශවල මිනිසුන්, එම ප්‍රදේශවල අතීතයේ ජීවත්ව ඇති ජන කොටස් තම ඥාතීන් ලෙස නොසලකති. වර්තමාන ආගමික හෝ සංස්කෘතික ඇදහිලි ක්‍රම අතීතයේ පැවති ඒවායින් වෙනස්වීම්[51], වෙනත් පෙදෙස්වලින් සිදුවූ සංක්‍රමණයන් පිලිබඳ සාමුහික මතකයන්, වෙනත් ජන කණ්ඩායම් හා සම්බන්ධවීම් නිසා පලිගැනීම් වලට ලක්විය හැකිවේය යන බිය, ප්‍රචණ්ඩත්වයට හා අවතැන්වීම් වලට තවමත් හේතුවන සමාජ-දේශපාලනික දර්ශන පථයන් බිඳ දමමින් යුරෝපීය යටත් විජිතවාදී පාලන සමයේදී ගන්නා ලද තීරණවල පසු-කම්පන මෙයට හේතු විය හැක. සංස්කෘතික උරුමයන් පිලිබඳ තීරණ ගැනීමේ බලය පැවරීමේදී, සමාජ ඝට්ටන උග්‍ර නොවන සේ වග බලා ගැනීමට මෙවැනි තත්වයන් තුල, දේශීය කණ්ඩායම් වල සිට රජයේ නියෝජිතයන් දක්වා පාර්ශවකරුවන් අතරේ සැලකිල්ලෙන් යුතුව සාකච්ඡා පැවැත්වීම අවශ්‍ය වේ. එවැනි අවස්ථාවලදී පෞරාණික ඩී. එන්.ඒ. විශ්ලේෂණ සිදු කිරීම සඳහා මධ්‍යස්ථයක් ලෙස ස්වදෙශීයත්වය සැලකීම හානිකර වීමට ඉඩ ඇත.

අප්‍රිකාවේ (මෙන්ම තවත් බොහෝ ප්‍රදේශවල) පෞරානික ඩී. එන්. ඒ. පර්යේෂණ පිලිබඳ වඩා හදිසි ගැටළුවක් වනුයේ සදාචාර-විරෝධී ලෙස එකතු කර බොහෝවිට විදේශයන්ට

යවන ලද මිනිස් අවශේෂ පිලිබඳ යටත් විජිතවාදී උරුමයනට මුහුණ පෑමය[52-53]. පෞරාණික පුද්ගලයන්ගේ අවශේෂ අධ්‍යයන කිරීම සඳහා අවසර ලබා ගැනීමට සහ සම්භවයන්, ඓතිහාසික අසාධාරණකම්, ආපසු භාරදීම් සහ ප්‍රතිෂ්ඨාපනයන් පිළිබඳව සාකච්ඡා කිරීමට, පර්යේෂකයන් එම ද්‍රව්‍ය භාර ආයතන සමග මෙන්ම ඒවා එකතු කරනු ලැබූ රටේ විද්වතුන් සමග කටයුතු කළ යුතුය[54-56] (https://www.globalcodeofconduct.org/affiliated-codes/). දේශීයයන් අවම වශයෙන් සහභාගි කරගෙන යුරෝපීය සහ උතුරු ඇමෙරිකානු විද්‍යාඥයන් විසින් වැඩි වශයෙන්ම සිදු කර ඇති අයුක්තිසහගත සහ බොහෝ විට අසාධාරණ අන්දමේ පර්යේෂණ පිලිබඳ ඉතිහාසය ඒ හා සම්බන්ධිත අභියෝගයකි[25-27]. පර්යේෂන ප්‍රශ්න හා සැලසුම් සකස් කිරීමට පාර්ශවකරුවන්ට බලය ලබා දෙන, පුහුණු කිරීම් හා අනෙකුත් ධාරිතා වර්ධනයන් ද ඇතුළු සාධාරණත්වයෙන් යුත් සහයෝගිතාවයන් ඇති කර ගැනීමට විදේශීය පර්යේෂකයෝ ප්‍රමුඛතාවයක් දිය යුතුය[57].

**කණ්ඩායම්වල අනන්‍යතාවය ගැන අවධාරණය කිරීමෙන් සමහර ගෝලීය සන්ධර්භ තුල හානි සිදු වීමේ හැකියාවක් ඇත**

ස්වාදෙශිකයා යනු කවුරුන්ද යන්න පිළිබඳව පැවැත්වූ සාකච්ඡාවන්හිදී විජාතික භීතිකා හා ජාතිවාදී වෘත්තාන්තයන් හේතු වී ඇත. මෙවැනි ස්ථානවල පෞරාණික ඩී.එන්.ඒ පරීක්ෂණ වලට අනුමැතිය දිය හැක්කේ කවුරුන් විසින්ද යන්න තීරණය කිරීම සඳහා ස්වදේශීය අනන්‍යතාව භාවිතා කිරීම, කණ්ඩායම් අතර සට්ටන සහ වෙනස්කම් සිදුවීමට ඉඩ ඇති බැවින් හානි කර විය හැක.

උදාහරණයක් වශයෙන්, කණ්ඩායම් අනන්‍යතාව මත පදනම්වූ දීර්ඝ අපචාර ඉතිහාසය නිසා, ඉන්දියාවේ බොහෝ දෙනා කුල සහ ආගමික පසුබිම පිලිබඳව විමසීමෙන් වැළකී සිටී. කුල පදනම් කර ගෙන වෙනස්කම් සිදු කිරීම නීතියෙන් තහනම් කර ඇත. දැනට ජීවත්වන ප්‍රජා කණ්ඩායම් වලින් ඉතා විශාල කොටසක් එම අර්ධ-ද්වීපයේ සහශ්‍ර වර්ෂ කාලයක් වාසය කර ඇති මුතුන් මිත්තන් ගෙන් පැවත එන එකම ජන කොටස් වල මිශ්‍රනයන් වන බැවින්, පැරණි උරුමයට වැඩියෙන් හිමිකම් දැක්විය හැක්කේ කවර කණ්ඩායමකට ද යන්න තීරණය කිරීමට තැත් කිරීම සට්ටන වලට හේතුවී ඇති නමුදු, එය දකුණු ආසියාවේ වැඩි කොටසක අර්ථ-විරහිත ක්‍රියාවක් තරම් වී ඇත[58,59]. කෙසේවුවද, අන්දමන් දිවයින් වැනි තැන්වල ස්වදෙශීයයන් යනු කවුරුන් දැයි යන්න පැහැදිලි වේ[60]. දකුණු ආසියාවේ බොහෝ ප්‍රදේශවල සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා මැනවින් සැකසුනු නිලතන්ත්‍රයක් ඇත. ප්‍රජා කණ්ඩායම්වලට සිදුවිය හැකි හානිවලින් ආරක්ෂා කිරීම සඳහා මෙම රාමුව තුල ක්‍රියා කිරීම වැදගත් යන්ත්‍රණයක් වේ.

දේශීය සම්භවයක් ඇතැයි කියනු ලබන කණ්ඩායම්වලට විශේෂ තත්වයක් තිබිය යුතුය යන යෝජනාව බටහිර යුරෙසියාවේ විජාතික භීතිකාවකට සහ ජන සංහාරයකට හේතු වී ඇත. නාසි යුගයේදී ''ලේ සහ පස්'' පිලිබඳ අදහස දිරි ගැන්වූ ජාතිවාදීන්, බලහත්කාරයෙන් අල්ලා ගන්නා ලද ඉඩම් නිත්‍යානුකූල කිරීම සඳහා නැගෙනහිර යුරෝපයේ කැනීම් වලින් මතු කර ගන්නා ලද ඇට සැකිලිවල ජර්මානු රූපාකෘති ඇති බවට විද්‍යාත්මක පසුබිමක් තිබුණි[61] යනුවෙන් පුරාවිද්‍යාත්මක පර්යේෂණ විකෘති කළහ. ඇතැම් ප්‍රජා කණ්ඩායම් විසින් සංස්කෘතික උරුමයන් වලට හිමිකම් දක්වන වෘත්තාන්ත නිෂ්ප්‍රභ කිරීමට යුරෝපීය විද්‍යාඥයන් දශක ගණනාවක්ම ක්‍රියා කර ඇත. වෙනස්කම්වලට භාජනය වූ ජාතික සුළු ජන කොටස් වල දෘෂ්ඨිකෝනයනට ගරු කරන අතරම, ඇතැම් භූමි ප්‍රදේශවලට ආදි සම්බන්ධතා ඇතැයි යන ආත්ම-සංකල්පනාත්මක හැඟුම් වලින් මෙම ව්‍යාපාරය ඉවතට ගැනීමට බටහිර යුරෝපියානු පසුබිමක පෞරාණික ඩී. එන්. ඒ. සදාචාර පර්යේෂණවලින් සිදු විය යුතුය[61,62]. සමූහ අනන්‍යතාවන් පිලිබඳ පක්ෂපාතී වෘත්තාන්ත වලට සහාය දැක්වීමට රාජ්‍ය නායකයන් පුරාවිද්‍යාත්මක සහ පෞරාණික ඩී.එන්.ඒ පර්යේෂණ ආචාර විධි ලබා ගෙන, බැහැර කරණ ප්‍රතිපත්ති සාධාරණීය කිරීමේ අනතුර හුදෙක් න්‍යායාත්මක මතයක් පමණක් නොව හංගේරියාව සහ ඊශ්‍රායල් ඇතුළු බටහිර යුරෝසියාවේ ඇතැම් රටවල අද පවතින ගැටලුවකි[63-65].

**සදාචාරාත්මක පෞරාණික ඩී. එන්. ඒ. පර්යේෂණ සඳහා ගෝලීයව අදාළ වන මාර්ගෝපදේශ පහක්**

ඉහත සාකච්ඡා කළ පර්යේෂණ සන්ධර්භයන් තුල මෙන්ම ඉඩකඩ සීමාවන් නිසා අපි සාකච්ඡා නොකළ මධ්‍යම ආසියාව, සයිබීරියාව, නැගෙනහිර ආසියාව, අග්නිදිග ආසියාව සහ ඕෂෙනියාව ඇතුළු ලෝකයේ අනිකුත් ප්‍රධාන ප්‍රදේශ වල ද පෞරාණික ඩී. එන්. ඒ. පර්යේෂණවල සදාචාරාත්මක ප්‍රමිති ශක්තිමත් ලෙස වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ පහක් අපි ඉදිරිපත් කරමු (කොටුව 1). විද්‍යාත්මක ආචාර ධර්ම ගැටළු පිළිබඳ සාකච්ඡා කරන මාර්ගෝපදේශ වලින් අරඹා, ස්වදේශීය කණ්ඩායම් ඇතුළු ප්‍රජාවන්ගේ පර්යාලෝක සඳහා පර්යේෂනවල සංවේදිතා රැක දීමේ මාතෘකාවට ආපසු යමු.

(1) **තමන් සේවය කරණ ස්ථානවල සහ මානව අවශේෂ ලබා ගත් ස්ථාන වල, රෙගුලාසි සියල්ලම අනුගමනය කරණ ලද බවට පර්යේෂකයන් වග බලා ගත යුතුය.** මානව සාම්පල ලබා ගත් ස්ථානයේ පරිසරය සැලකිල්ලට ගෙන, පෞරාණික ඩී.එන්.ඒ පර්යේෂණ සිදු කිරීම සදාචාරාත්මක දැයි පර්යේෂකයන් සැලකිලීමත් විය යුතුය. ව්‍යාපෘතියක නිරත වීම ඇරඹූ විට පර්යේෂකයන් සියලුම දේශීය රෙගුලාසි වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙය ඉතා

පැහැදිලි දෙයක් ලෙස පෙනුණ ද පෞරාණික ඩී.එන්.ඒ පර්යේෂකයන් සියලුම රෙගුලාසි සැමවිටම අනුගමනය කර නැති බව සමහර සම-කතුවරුන්ගේ අත්දැකීම වේ.

උදාහරණයක් වශයෙන් විද්‍යාත්මක විශ්ලේෂණ සඳහා හෝ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය අපනයනය සඳහා, ආයතනික, දේශීය, ප්‍රාදේශීය හෝ ජාතික ආයතනවලින් මට්ටම් කිහිපයකින් අවසර ලබා ගැනීමත් භාරත්වය දරන ආයතනවලට එකඟවූ කාල-රාමුවලට අනුව වාර්තා ඉදිරිපත් කිරීමත් අවශ්‍ය විය හැක. දේශීය රෙගුලාසි ප්‍රමාණවත් නොවන විට[66] පහත සඳහන් මූලධර්ම අනුගමනය කරමින් වඩා උසස් ප්‍රමිතියිකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(2) **කවර හෝ අධ්‍යයනයක් ආරම්භ කිරීමට පෙර පර්යේෂකයන් විස්තරාත්මක සැලසුමක් පිළියෙළ කළ යුතුය.** පර්යේෂණ ප්‍රශ්න පැහැදිලිව පළ කිරීම; භාවිතා කිරීමට අපේක්ෂිත ශිල්පීය ක්‍රම පිළිබඳ විස්තරයක් සහ අවශේෂ වලට ඇතිවිය හැකි බලපෑම (අධ්‍යයනය කළ යුතු ඇට සැකිලි කැබලි සහ භාවිතා කරනු ලබන ප්‍රමාණයන් ඇතුළුව); උත්පාදනය කෙරෙන ඩී.එන්.ඒ දත්ත වර්ගය පිළිබඳ විස්තරයක්; සහයෝගීව ක්‍රියා කරණ රසායනාගාර සමග ද්‍රව්‍ය බෙදා ගැනීම සඳහා වන සැළසුම් කිසිවක් වේනම් ඒ බව; භාවිතා නොකළ ද්‍රව්‍ය ආපසු භාර දීම සහ පර්යේෂණ ප්‍රතිඵල බෙදා ගැනීම සඳහා කාල රාමුවක්, ප්‍රතිඵල කෙසේ, කොතනදී හා කවුරුන් විසින් ව්‍යාප්ත කරනුයේද යන්න ගැන සැලසුමක්; අවශ්‍යතාවය ඇති ස්ථාන වල ධාරිතාව දියුණු කිරීම හෝ පුහුණුවීම් ලබා දීම පිළිබඳ සැළසුමක් සහ විවෘත දත්ත මූලධර්ම වලට අනුකූලව දත්ත ගබඩා කිරීම, බෙදා ගැනීම ගැන පාර්ශවකරුවන් එකඟවී ඇති සැලසුමක් ද ඇතුළු විය යුතුය[67]. පර්යේෂණයෙහි විෂය පථය, සැලසුමෙහි විස්තර කළ යුතු අතර, ජාන දත්ත විශ්ලේෂණයන් අනපෙක්ෂිත දිසා වෙත යොමුවිය හැකි බව සැලකිල්ලට ගනිමින් පර්යේෂණයෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල ගැන අවංකව දැනුම් දිය යුතුය. අපේක්ෂිත පර්යේෂණයෙන් බැහැරවීමක් පසුව සිදුවුවහොත් විමසා බැලිය හැකි වන වාර්තාවක් එවැනි සැලසුමකින් ඇති වේ. අධ්‍යයන සැලසුමෙහි කිසියම් වෙනස්කමක් සිදු කළ යුත්තේ මුල් ගිවිසුමට සම්බන්ධවූවන්ගේ සහයෝගය ඇතිව පමණි; පෞරාණික පුද්ගලයන්ගේ අවශේෂ අධ්‍යයන කිරීම සඳහා අනුමැතිය දුන් විට, අනුමැතිය ලබා ගත්තාවූ කාර්‍යය සඳහා ඔවුන් එම ද්‍රව්‍යවල භාරකරුවන් බවට පත් වෙතත් ‘අයිතිය’ මාරු නොවන බව පර්යේෂකයන් පිළිගත යුතුය[68]. මානව අවශේෂ වලට වග කියන්නන් හා ඉදිරි දැක්ම පිළිබිඹු කළ යුතු වන සෙසු කණ්ඩායම් සමග තමන්ගේ සැළසුම පිළිබඳ විස්තර බෙදා ගැනීම පර්යේෂකයන්ගේ වගකීම වේ; එබැවින්,එය පිළියෙළ කළ යුතු වනුයේ විශේෂඥ-නොවන අයටද වටහා ගැනීමට හැකිවන පරිදිය. සුදුසු වනුයේ නම් සහ අදාළ සියලුම පාර්ශවයන් එකඟ වේනම්, මානව අවශේෂයන් භාරව පැවතියේ ඒවා ආවේනික ප්‍රදේශ වලින් බැහැරව නම්, ඒවා ආපසු භාර දීම පිළිබඳ ගමන් මගක් ද පර්යේෂණ සැළසුමට ඇතුළු කිරීම සුදුසු වේ.

**(3) මානව අවශේෂ වලට සිදු වන හානි අවම කිරීමට පර්යේෂකයන් ක්‍රියා කළ යුතුය.** අන් සැකිලි කොටස් වලට වඩා මානව ජාන දත්ත කිහිප ගුණයක් සපයන ප්‍රස්තරීක අස්ථිය (petrous bone) [69-72] කෙරෙහි මෑතදී ඇතිවී තිබෙන අවධානය ගැන සැලකීමේදී, මානවවේද අස්ථි එකතුකිරීම් කෙරෙහි පර්යේෂණ වල බලපෑම අවම කිරීම විශේෂයෙන්ම වැදගත්වේ. තමන්ගේ පර්යේෂණාත්මක විශ්ලේෂණ සමග මානව අවශේෂ ආරක්ෂා කිරීම් සමබර කර ගැනීම පිළිබඳව පර්යේෂකයන් සෙසු පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර නිසි උපාය මාර්ගයක් සකස් කර ගත යුතුය. ප්‍රයෝජනයට ගත හැකි දත්ත වල උපරිම ප්‍රතිඵල ලබා ගන්නා අතර සිදුවිය හැකි හානි අවම කළ හැකි වඩාත්ම යොග්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණුව නොලබා පර්යේෂකයන් විසින් මිනිස් අවශෙෂ එකතු නොකළ යුතුය[11,12,73-76]. පර්යේෂකයන් විසින් තමන්ගේ පර්යේෂණ ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගත හැකි ප්‍රමාණයට වඩා සාම්පල ලබා නොගත යුතු අතර, ඒවා ලබා ගන්නා ලද්දේ කෙදිනක ද යනුවෙන් සාම්පල ලබා ගැනීම පිළිබද ලිඛිත සටහන් මානව අවශේෂයන්ට වගකිව යුත්තන්ට සැපයිය යුතුය. ඩී.එන්.ඒ සංරක්ෂණය දුර්වල වූ අවශේෂ පිළිබඳව, සමාන ක්‍රම භාවිතා කරමින් නැවත විශ්ලේෂණ කිරීම වැළැක්වීම සඳහා රිනාත්මක ප්‍රතිඵල වාර්තා කළ යුතුය. සාම්පල ලබා ගැනීමට පෙර, අධි-විභේදන සහ ජෛව-පුරාවිද්‍යාත්මක තක්සේරු කිරීම් අනුව රූප අධ්‍යයනය සිදු කර ලේඛනගත කළ යුතුය. අඩු වශයෙන් ඉතාම පෞරාණික පුද්ගලයන් සම්බන්ධයෙන් හෝ අද්විතීය සන්දර්භ වල තැනැත්තන් සඳහා ශුද්‍ර පරිගණක ආධාරිත පරීක්ෂණ (මයික්‍රෝසී.ටී.ස්කෑන් පරීක්‍ෂණ) හෝ වාත්තු(කාස්ට්ස්) ඉදිරිපත් කළ යුතුය. කිසියම් ස්ථානයක ඩී.එන්.ඒ සංරක්‍ෂණයන් ඇගයීමට පෙර සත්ව හෝ රෝග විනිශ්චය-නොවන අවශේෂ පිළිබඳ විශ්ලේෂණ සිදුවිය යුතු දැ යි සාකච්ඡා කළ යුතුය.

සාම්පල ලබා ගත් පසු, මානව අවශේෂ, ඉතා වගකීමෙන් ආරක්ෂා කිරීම සහ ද්‍රව්‍ය බෙදා ගැනීමෙන් ඩී.එන්.ඒ නිස්සාරයන් වැනි අනුක නිෂ්පාදන සහ ඩී.එන්.ඒ පුස්තකාල නිර්මාණය සිදු කළ හැක. එමගින්, පසුව සිදු කෙරෙන පර්යේෂණ අධ්‍යයනවලදී අමතර සාම්පල ලබා ගැනීමේ අවශ්‍යතාවය අඩු වෙනු ඇත. අධ්‍යයන නැවත සිදු කිරීම සඳහා, නිගමනය කරණ ලද අණුක නිෂ්පාදන නඩත්තු කිරීමේ වගකීම පර්යේෂකයන් සතු වේ. සාම්පල මානව අවශේෂ සහ නිගමනය කරණ ලද නිෂ්පාදන, රසායනාගාර අතරේ බෙදා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අපි පර්යේෂකයන් දිරිගන්වන්නෙමු. අනුමතවූ පර්යේෂණ සැලසුමකට මෙම භාවිතයන්, අනුරූප වන තාක් කල් මූලික අධ්‍යයනයේදී නගන ලද ප්‍රශ්න පිළිබඳ නැවත තක්සේරු කිරීම මෙන්ම මූලික අධ්‍යයනයේ විෂය පථයෙන් ඔබ්බට ගිය අතිරෙක විශ්ලේෂණ සිදු කිරීමට ද මෙයින් හැකිවේ.

**4. විද්‍යාත්මක ප්‍රතිඵල ප්‍රකාශ කළ පසු, ඒවා විවේචනාත්මකව නැවත පරීක්ෂා කිරීමට හැකි වන පරිදි පර්යේෂකයන්, අදාළ දත්ත ලබා ගැනීමට ඉඩ සැලසිය යුතුය.** පෞරාණික ඩී.එන්.ඒ. දත්ත කාලෝචිත අයුරකින් පළ කර ප්‍රතිඵල විවේචනාත්මකව නැවත තක්සේරු කිරීම සඳහාත් පහසුකම් සැලසිය යුතුය[77,78]. ප්‍රකාශිත ප්‍රතිඵල වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහාවත් දත්ත ලබා ගත හැකි බවට සහතිකයක් නොමැති නම් විද්‍යාඥයන්ට සදාරාචාත්මකව අධ්‍යයනයකට සහභාගී විය නොහැක. අධ්‍යයනය සඳහා මුලදී අවසරය දෙන ලද ලිපියට මෙම සහතිකය ඇතුළු කළ යුතුය. වැරදි ප්‍රචාර පැතිරීම වලක්වාලීම සඳහා මෙන්ම එම ප්‍රශ්න ගැනම නැවත විමසීමට තැත් කෙරෙන අනාගත විශ්ලේෂන ද පහසු කරවීම සඳහා මෙය වැදගත් වේ.

ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, දත්ත සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට ඉඩ සැළසීම ඉතා යහපත් ක්‍රියාමාර්ගයක් වන අතර සියලුම පාහේ පෞරාණික ජෙනොම දත්ත, පොදු දත්ත ගබඩාවල මෙලෙස පළ කර ඇත. මෙය මෙම ක්ෂෙත්‍රයෙහි සදාචාරාත්මක ශක්තියක් වී ඇත[79]. විද්‍යාත්මක දැනුම වර්ධනයවීම සඳහා ආධාර කිරීමට අමතරව, දත්ත සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට සැලැස්වීමෙන්, දත්ත නැවත ප්‍රයෝජනයට ගැනීමට හැකිවීම නිසා, තවදුරටත් සාම්පල ලබා ගැනීමේ අවශ්‍යතාවය අඩු කෙරෙන බැවින් එමගින්, මානව දේහයන් පිලිබඳ භාරකාරත්වය වගකීමකින් යුතු කාර්යයක් බවට පත් කිරීමට ද හේතුවේ. සමහර විශ්ලේෂණ වර්ග වල ප්‍රතිඵල වාර්තා කිරීමේදී මුළුමනින්ම විවෘත දත්ත වලින් ලැබිය හැකි වාසි වලට වඩා, පාර්ශවකරුවන්ට හානිදායක විය හැකි බැවින් පෞරාණික ඩී.එන්.ඒ දත්ත නැවත භාවිතා කළ හැකි ක්‍රම සීමා කිරීම සදාචාරාත්මක යයි පාර්ශවකරුවන් අතර සාකච්ඡා වලදී හෙළි වීමට ඇති අවස්ථා අපට සිතා ගත හැක[6,10,80]. අධ්‍යයනය ආරම්භ කිරීමට පෙරාතුව ක්‍රියාවලියකදී, මෙම අවස්ථා අඳුනා ගෙන අධ්‍යයන ප්‍රතිඵල නැවත තක්සේරු කිරීම සඳහා පමණක් දත්ත විශ්ලේෂණය කිරීමට එකඟ වන, සුදුසුකම් ලද පර්යේෂකයන්ට පමණක් දත්ත බෙදා දීම සීමා කිරීම මුල් පර්යේෂණ සැලසුමේ කොටසක් විය යුතුය.

දත්ත සම්පූර්ණයෙන්ම ප්‍රසිධියේ ලබා ගැනීමට නොමැති විට ප්‍රතිඵල තීරණාත්මකව නැවත විමසා බැලීම සඳහා දත්ත කළමනාකරණය සහ බෙදා හැරීම සිදු කළ යුත්තේ, දත්ත අව-භාවිතය වැළැක්වීම ගැන විශේෂඥ දැනුම ඇති, පර්යේෂණ ප්‍රතිඵල ගැන උනන්දුවක් නොමැති සංවිධානයක් විසිනි. ප්‍රතිඵල පල කිරීමෙන් පසු පර්යේෂකයන්ට දත්ත බෙදා හැරීමේ සහ කළමනා කිරීමේ වගකීම කෞතුකාගාර හෝ ආදිවාසී සමුහයන් වැනි පාර්ශවකරුවන්ට පැවරිය හැකි යයි යෝජනාවී ඇත[10,13,15,83]. කෙසේ වුවද, මූලික පර්යේෂණ ගිවිසුමෙන් ආවරණය වූ ප්‍රශ්න විවේචනාත්මකව නැවත විමසා බැලීමේ අරමුණ සඳහා ක්‍රියා කරණ සුදුසුකම් ලත් පර්යේෂකයන්ට; පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව සැලකිල්ලක් දක්වන කණ්ඩායම් විසින් දත්ත ලබා ගැනීම වැළැක්විය හැකි අධ්‍යයනයක සහභාගිවීම වෘත්තිමය ආචාරධර්ම වලට අනුකුල නොවේ. මුළුමනින්ම ප්‍රසිද්ධ කර නොමැති

